# මාර්ගඵල ඇති උපාසක උපාසිකාවන් බහුල ව මෙසේ වාසය කරන්නේය මාර්ගඵල ලැබීමට ඔවුන් අනුකරණය කරන්න

## මහානාම සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 4 - පිටු අංක 12 - 17)

එක්කලෙක බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි වසන සේක. මහානාම ශාක්‍යයා පැමිණ බුදු රජාණන් වහන්සේට වැඳ එකත් පස් ව හිඳ මෙසේ ඇසුවේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ලැබූ මාර්ගඵල ඇති බුදු සසුන අවබෝධ කළ ආර්ය ශ්‍රාවකයෙක් කවර ලෙස බහුල ව වාසය කරන්නේ ද?

මහානාමයෙනි, යම් මාර්ගඵල ඇති බුදු සසුන අවබෝධ කළ ආර්ය ශ්‍රාවකයෙක් වේ නම් ඔහු මෙලෙස බහුල ව වාසය කරන්නේ වෙයි.

1. මෙසස්නෙහි ආර්ය ශ්‍රාවකයා මෙසේ තථාගතයන් වහන්සේ අනුස්මරණය කරයි.

   ඒ භාග්‍යවතුන් වහන්සේ රහසින්වත් පව් නොකළ බැවින් ***අරහත්ය.*** පෙර නොඇසූ චතුරාර්ය සත්‍ය තමා විසින් ම මැනවින් අවබෝධ කොට එහි සියල්ල දත් එනම් සර්වඥ බවට සහ බල ඥානයෙහි වශී භාවයට පැමිණි බැවින් ***සම්මා සම්බුද්ධ*** වන සේක.

   දෙවියන්, බ්‍රහ්මයන්, මරුන්, බමුණන් හා පැවිද්දන් සහිත ලෝකයේ ඒ සියල්ලන් අභිබවා විශිෂ්ට නුවණකිනුත්, මනා පිරිසිදු හැසිරීමකිනුත් යුක්ත වූ බැවින් ***විජ්ජාචරණ සම්පන්න*** වන සේක. සියලු කෙලෙස් නැසූ බැවින් ***සුගත*** වන සේක.

   අපාය, මිනිස්, දිව්‍ය ලෝක මැනවින් දැන එහි සත්‍ය ස්වභාවය ස්කන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, ප්‍රත්‍ය ආදී වශයෙන් පනවා ලෝක නිරෝධ ගාමිනී ප්‍රතිපදාව ලොවට මැනවින් හෙළි කළ බැවින් ***ලොකවිදූ*** වන සේක.

හික්මවීමට අපහසු ප්‍රචණ්ඩ අංගුලිමාල, ආලවක යක්‍ෂයා, නාළාගිරි ඇතා ආදීන් මනා ලෙස හික්මවන ලද සේක. මෙසේ පුරුෂයන් දමනය කිරීමේ අග්‍ර වන බැවින් ***අනුත්තරෝ පුරිසදම්මසාරථී*** වන සේක.

මාගේ ඒ භාග්‍යවත් වූ බුදු රජාණන් වහන්සේ සියලු දෙව් මිනිසුන්ට ශාස්තෘන් වන බැවින් ***සත්තා දේව මනුස්සානං*** වන සේක. ***බුද්ධ*** වන සේක. ***භාග්‍යවත්*** වන සේක.

මහානාමයෙනි, යම් කලෙක ආර්ය ශ්‍රාවකයා මෙසේ තථාගතයන් වහන්සේ අනුස්මරණය කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද (යටත් කරන ලද) සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් (මෝඩකමෙන්) මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත තථාගතයන් අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේ, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ **බුද්ධානුස්සතිය** වඩන්නේ වෙයි.

2. මෙසස්නෙහි ආර්ය ශ්‍රාවකයා තථාගතයන් වහන්සේගේ ධර්මය මෙසේ අනුස්මරණය කරයි.

   භාග්‍යවතුන් වහන්සේගේ සද්ධර්මය රාග, ද්වේෂ හා මෝහ ප්‍රහාණය පිණිස මනා කොට දේශනා කර ඇත. එනම් ***ස්වක්ඛාත*** වෙයි.

   මේ ජීවිතයේ දී ම ප්‍රතිඵල ලැබිය හැකි සහ තමා විසින් ම දැකිය හැකි එනම් ***සන්දිට්ඨික*** වෙයි. කල් නොයවා විපාක දෙයි. එනම් ***අකාලික***

වෙයි. ඇවිත් බලන්න යැයි කීමට සුදුසුය. එනම් ***එහිපස්සික*** වෙයි. තමා තුළට පමුණුවා ගත යුතුය. එනම් ***ඔපනයික*** වෙයි. නුවණැත්තන් විසින් තම තමන්ගේ ම නැණ පමණින් අවබෝධ කර ගත යුතුය. එනම් ***පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී ති*** වෙයි.

මහානාමයෙනි, යම් කලෙක ආර්ය ශ්‍රාවකයා මෙසේ තථාගතයන් වහන්සේගේ ධර්මය අනුස්මරණය කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත මෙසේ තථාගතයන් වහන්සේගේ ධර්මය අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේ, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේ, මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ **ධම්මානුස්සතිය** වඩන්නේ වෙයි.

3. මෙසස්නෙහි ආර්ය ශ්‍රාවකයා මෙසේ තථාගතයන් වහන්සේගේ සංඝරත්නය අනුස්මරණය කරයි.

   තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂු පිරිස රාග, ද්වේෂ හා මෝහ ප්‍රහාණය පිණිස මනා ව ගමන් කරන්නේ, එනම් ***සුපටිපන්න*** වෙයි. ඇද නැති ව ඍජු ව ගමන් කරන්නේ, එනම් ***උජුපටිපන්න*** වෙයි. නිවැරදි වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නේ, එනම් ***ඤායපටිපන්න*** වෙයි. නිවැරදි යහපත් මගෙහි ගමන් කරන්නේ, එනම් ***සාමීචිපටිපන්න*** වෙයි.

   සෝවාන් මාර්ග සහ ඵල, සකදාගාමි මාර්ග සහ ඵල, අනාගාමි මාර්ග සහ ඵල, අරහත් මාර්ග සහ ඵල වශයෙන් පුරුෂ යුගළ

හතරක් හා පුද්ගලයන් අට දෙනෙක්, එනම් ***චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා*** වෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂු පිරිස වෙත, දුර සිට හෝ පැමිණ පූජාවන් සිදු කිරීමට සුදුසුය. එනම් ***ආහුණෙය්‍ය*** වන්නේය. ආගන්තුක සත්කාරයට සුදුසුය. එනම් ***පාහුණෙය්‍ය*** වන්නේය. මතු විපාක ලබා ගැනීම සඳහා දෙන දානය පිළිගැන්වීමට සුදුසුය. එනම් ***දක්ඛිණෙය්‍ය*** වන්නේය. දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසුය. එනම් ***අඤ්ජලිකරණීය*** වන්නේය.

එනම් ලොවට ඉතා ම උතුම් පින් කෙතකි. එනම් ***අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති*** වන්නේය.

මහානාමයෙනි, යම් කලෙක ආර්ය ශ්‍රාවකයා මෙසේ තථාගතයන් වහන්සේගේ සංඝරත්නය අනුස්මරණය කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත මෙසේ තථාගතයන් වහන්සේගේ සංඝරත්නය අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේ, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේ, මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ **සංඝානුස්සතිය** වඩන්නේ වෙයි.

4. මහානාමයෙනි, මෙසස්නෙහි ආර්ය ශ්‍රාවකයා තමාගේ සීලය මෙසේ අනුස්මරණය කරයි.

   නොකැඩුණු, තැනින් තැන සිදුරු නොවූ, කැලැල් රහිත, ඒකාකාරී වූ, පිරිසිදු වූ, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන, සිතින් දැඩි ලෙස නොගත්, සමාධිය පිණිස පවතින තමාගේ සීලය සිහි කරයි.

මහානාමයෙනි, යම් කලෙක ආර්ය ශ්‍රාවකයා මෙසේ තමාගේ සීලය අනුස්මරණය කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත තම සීලය අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේය, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේය, මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ සීලානුස්සතිය වඩන්නේ වෙයි.

5. මහානාමයෙනි, මෙ සස්නෙහි ආර්ය ශ්‍රාවකයා තමාගේ ත්‍යාගශීලිබව මෙසේ අනුස්මරණය කරයි.

   ඒකාන්තයෙන් මට ලාභයෙකි. යම්බඳු වූ මසුරුකමෙන් යටත් කරන ලද මිනිසුන් අතරෙහි මම පහවූ කිළුටෙන් සහ මසුරුකමෙන් යුතු ව ගිහි ගෙයි වෙසෙමි. ත්‍යාගය පිණිස මුදන ලද පිරිසිඳු දැත් ඇත්තේ වෙයි. පරිත්‍යාගයට කැමති බැවින් යමෙකුට ඉල්ලීමට සුදුසු වූයේ ද වෙයි. බෙදා දීමෙහි ද ඇලුණේ වෙයි. ඒකාන්තයෙන් මට මනා කොට ලැබුමකි.

මහානාමයෙනි, යම් කලෙක ආර්ය ශ්‍රාවකයා මෙසේ තමාගේ ත්‍යාගය අනුස්මරණය කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත තම ත්‍යාගය අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේය, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේය, මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ ත්‍යාගානුස්සතිය වඩන්නේ වෙයි.

6. මහානාමයෙනි, මෙ සස්නෙහි ආර්ය ශ්‍රාවකයා මෙසේ දෙවියන් අනුස්මරණය කරයි.

   චතුර්මහාරාජික දෙවියෝ ද සිටිති, තව්තිසා දෙවියෝ ද සිටිති, යාම දෙවියෝ ද සිටිති, තුසිත දෙවියෝ ද සිටිති, නිම්මානරති දෙවියෝ ද සිටිති, පරනිම්මිතවසවත්තියේ වාසය කරන දෙවියෝ ද සිටිති. බ්‍රහ්ම ලෝකයේ වසන බ්‍රහ්මයෝ ද සිටිති. ඉන් මත්තෙහි වසන දෙවියෝ ද සිටිති.

   තුනුරුවන් කෙරෙහි යම් බඳු ශ්‍රද්ධාවකින් යුක්ත ව මෙලොවින් චුත වී දෙව්ලොව උපදින්නේ ද, තුනුරුවන් කෙරෙහි එබඳු ශ්‍රද්ධාවක් මට ද ඇත.

   යම් බඳු සීලයකින් යුක්ත ව මෙලොවින් චුත වී දෙව්ලොව උපදින්නේ ද, එවැනි සීලයක් මට ද ඇත.

   යම් බඳු දහම් දැනුමකින් යුක්ත ව මෙලොවින් චුත වී දෙව්ලොව උපදින්නේ ද, එවැනි දහම් දැනුමක් මට ද ඇත.

යම් බඳු පරිත්‍යාගයකින් යුක්ත ව මෙලොවින් චුත වී දෙව්ලොව උපදින්නෝ ද, එවැනි පරිත්‍යාගයක් මට ද ඇත.

යම් බඳු වූ නුවණකින් යුක්ත ව මෙලොවින් චුත වී දෙව්ලොව උපදින්නෝ ද, එවැනි නුවණක් මට ද ඇත.

මෙසේ තමාගේ සහ දෙවියන්ගේ ශ්‍රද්ධාව, සීලය, දහම් දැනුම, පරිත්‍යාගය හා නුවණ ගැන සිහි කරන්නේ ද එකල ඔහුට රාගයෙන් මඩින ලද සිතක් නොම වෙයි. ද්වේෂයෙන් මඩින ලද සිතක් නොම වෙයි. මෝහයෙන් මඩින ලද සිතක් නොම වෙයි. එසමයෙහි ඔහුගේ සිත දෙවියන් අරබයා ඍජුගත ම වෙයි.

ඍජුගත සිතෙන් යුත් ආර්ය ශ්‍රාවකයා අර්ථය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය පිළිබඳ උනන්දුව ද ලබන්නේය, ධර්මය අවබෝධය හේතුවෙන් ප්‍රමෝදය ද ලබන්නේය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතිමත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙන්නේය. සන්සිඳුණු කය ඇත්තේ සැප විඳින්නේය. සැප විඳින්නහුගේ සිත සමාධියට පත්වන්නේය.

මේ ආර්ය ශ්‍රාවකයා රාග, ද්වේෂ සහ මෝහ හේතුවෙන් විෂම ව හැසිරෙන පිරිස් අතර සම ව වාසය කරන්නේය, හිංසා කරන්නන් අතර අවිහිංසාවෙන් වාසය කරන්නේය, මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ දේවතානුස්සතිය වඩන්නේ වෙයි.